# පශ්චාත් නිර්බාධීකරණ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ ආදායම් විෂමතාවය පිළිබඳ සංක්ෂිප්ත අධ්‍යයනයක්

**යූ. ඩබ්. බී. එම්. කුමාරි සහ ජේ. ජී. ශ්‍රී රංජිත්**

*ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය*

***මූල පදඃ*** *ආර්ථික වර්ධනය; ආදායම් විෂමතාවය; ගිණි සංගුණකය*

## හැඳින්වීම

ආර්ථික විද්‍යාවේදී ආදායම් විෂමතාවය යන්නෙන් අදහස් වන්නේ රටක සමස්ත ජනගහණය අතර එරට මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අසමාන ආකාරයෙන් ව්‍යාප්තවී යාමයි. සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයින් (Adam Smith, Thomas Malthus, David Ricardo) ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ සාධක ආදායම් ව්‍යාප්තිය (Factor Income Distribution) පිළිබඳවයි. ආදායම සහ එහි ව්‍යාප්තිය සෑම විටම ආර්ථික න්‍යායන් තුළ සහ ආර්ථික ප්‍රතිපත්තිවල මූලික අවධානයට යොමු වන කරුණුවේ. නූතන ආර්ථික විද්‍යාඥයින් විසින්ද මෙම තත්ත්වය විශ්ලේෂණයේදී ඔවුන් වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ තනි පුද්ගලයින් සහ කුටුම්භ අතර ආදායම් ව්‍යාප්තිය සිදුවන ආකාරය පිළිබඳවය. ඒ අනුව බොහෝ න්‍යායන් සහ ප්‍රතිපත්ති ආශ්‍රයෙන් ආදායම් විෂමතාවය සහ ආර්ථික වර්ධනය අතර සම්බන්ධතාවය පෙන්වා දී ඇත. ආර්ථික වර්ධනය සමගින් කිසියම් රටක ආදායම් විෂමතාවය වෙනස්වන ආකාරය මෙන්ම ආදායම් විෂමතාවය සඳහා බලපාන සාධක මොනවාද යන ගැටලු නිරන්තරයෙන් සංවර්ධන ආර්ථික විද්‍යාවේදී ඉහළ අවධානයකට යොමුවන වැදගත් කරුණක්වේ.

ආදායම් විෂමතාව සංකල්පය මූලිකවම පැමිණෙන්නේ දරිද්‍රතාවය සහ සාධාරණත්වය මූලික කරගෙනය. රටක පවත්නා ආදායම් විෂමතාවයට හේතු වශයෙන් එරට ක්‍රියාත්මක වන බදු ප්‍රතිපත්ති, අනෙකුත් ආර්ථික ප්‍රතිපත්ති, සම්පත් හිමිකම, ශ්‍රම වෙළඳපොළ තත්ත්ව, වෘත්තීය සමිති ක්‍රියාකාරකම්, ශ්‍රමික හැකියාවන්, මූල්‍ය ප්‍රතිපත්ති, තාක්‍ෂණය, අධ්‍යාපනය, ගෝලීයකරණය, සංස්කෘතිය යනාදී වශයෙන් කරුණු රැසක් පෙන්වා දිය හැකිය. එබැවින් ආදායම් විෂමතාවය වැදගත් සංකල්පයක් වන නිසා ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය සහ ආර්ථික වර්ධනය අතර සම්බන්ධතාවය කුමක්ද යන්න හඳුනාගැනීමත්, ආදායම් ව්‍යාප්තියෙහි මෑත කාලීන

ප්‍රවණතා හඳුනාගැනීමත් මෙරට ආර්ථික සංවර්ධනය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාගැනීමට වැදගත් වේ.

**අධ්‍යනයේ අරමුණු**

ආදායම් විෂමතාවය සහ ආර්ථික වර්ධනය අතර සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා මේ වන විට සිදු කර ඇති ආනුභවික අධ්‍යනයන් මගින් ලැබී ඇති ප්‍රතිඵල පිළිබඳව අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ඒ සම්බන්ධයෙන් ලැබී ඇත්තේ මිශ්‍ර ප්‍රතිඵල බවයි. ඒ අනුව Kuznet විසින් ඉදිරිපත් කළ "ආදායම් විෂමතාවයේ අපවර්තිත U හැඩය" පිළිබඳ කල්පිතය ඇතැම් රටවල් සම්බන්ධයෙන් වලංගු නොවන බව තහවුරු වී ඇත (Todaro & Smith 2012; Wahiba & Weriemmi 2014). ඒ අනුව ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය සහ ආර්ථික වර්ධනය අතර සම්බන්ධතාවය කෙසේද යන්න සහ එය Kuznet විසින් ඉදිරිපත් කළ ආදායම් විෂමතාවයේ අපවර්තිත U හැඩය පිළිබඳ කල්පිතය සමඟ එකඟ වන්නේද යන්න ආනුභවිකව විශ්ලේෂණය මෙම අධ්‍යනයෙහි අරමුණවේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේදී පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය සහ ආර්ථික වර්ධනය අතර පවතින සම්බන්ධතාවය හඳුනාගැනීම සඳහා වර්ෂ 1948 -2012 කාල පරාසයට අයත් අදාල දත්ත භාවිතා කෙරේ. දත්ත විශ්ලේෂණය සඳහා ආර්ථිකමිතික ක්‍රමවේද සහ විස්තරාත්මක ක්‍රමවේද වන වගු සහ ප්‍රස්ථාර යොදාගනු ලැබේ. විශ්ලේෂණය සඳහා අවශ්‍ය සියලු දත්ත ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවලින් සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තාවන්ගෙන් ලබා ගන්නා ලදී.

**විශ්ලේෂණය**

වර්ෂ 1948 දී ශ්‍රී ලංකාව දේශපාලනික වශයෙන් නිදහස ලැබීමත් සමඟ බලයට පත් රජයන් විසින් ජනතාවගේ සුභසාධනය ඉහළ නැංවීම උදෙසා විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගෙන තිබේ. එම කාලයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී දක්නට ලැබෙන්නේ අඩු ආර්ථික වර්ධන තත්ත්වයකි. නමුත් එම අවධියේදී ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම අරමුණු කරගනිමින් බොහෝ සුභසාධන වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කර ඇති බව හඳුනාගත හැකිය.

වගු අංක 1: ආදායම් ව්‍යාප්තිය 1953-1978

| කාණ්ඩය | 1953 | 1963 | 1973 | 1978 |
|---|---|---|---|---|
| මසකට මධ්‍යනය ආදායම (රුපියල්) | 108 | 134 | 228 | 574 |
| මසකට මධ්‍යස්ථ ආදායම (රුපියල්) | 68 | 83 | 180 | 352 |
| අවම 10% ට හිමිවන ආදායම | 1.5 | 1.2 | 1.8 | 1.5 |
| අවම 40 % | 13.0 | 12.0 | 15.1 | 12.3 |
| ඉහළම 10 % | 42.5 | 39.2 | 30.0 | 39.0 |
| ගිණි සංගුණකය | 0.5 | 0.49 | 0.41 | 0.49 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, විවිධ වර්ෂ

ඉහත වගු අංක 01 හි දත්ත අනුව ශ්‍රී ලංකාව නිදහස ලැබූ මුල් අවධියේ සිට ඉහළ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වුවද මෙරට ආදායම් විෂමතාවය සැළකිය යුතු ඉහළ මට්ටමක පැවතී ඇත. ඒ සඳහා බලපා ඇති ප්‍රධාන හේතුන් වශයෙන් පෙන්වා දිය හැකි වන්නේ ශ්‍රම වෙළෙඳපොළ අපූර්ණතා, අනෙකුත් සාධකවල ව්‍යාප්තිය සහ භාණ්ඩ සහ සේවාවල සාපේක්ෂ මිලයන්ය (Vidanapathirana 2007). මෙම සාධක මූලික කරගනිමින් සමාජයේ විවිධ කණ්ඩායම් අතර ආදායම සැලකිය යුතු පරිදි විෂම ආකාරයෙන් ව්‍යාප්ත වී ඇත. නමුත් මෙම කාලයේදී රජය විසින් ලබාදුන් අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් සහ ආහාර බෙදාදීම යනාදිය හේතුකොටගෙන අඩු ආදායම් ලබන්නන්ට පහසුකම් සැලසුණද අඩු ආර්ථික වර්ධනය හේතු කොටගෙන ඔවුන්ගේ ආදායම් විෂමතාවයෙහි ප්‍රශස්ථ ලෙස අඩුවීමක් සිදුවී නොමැති බව තහවුරුවේ.

වගු අංක 01 සහ 02 දත්තවලට අදාලව ගිණි සංගුණක පහළ අගයක් ගනු ලබන්නේ 1973 දී පමණි. වර්ෂ 1973 දී 0.41 ක් වූ ගිණි සංගුණක අගය 1980/1981 දී 0.43 ක්ද 2009/10 දී 0.49 ක්ද ලෙස වාර්තාවෙයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික නිර්බාදීකරණයට පෙර සහ පසු ආදායම් ව්‍යාප්ති විෂමතාවය ඉහළ ගොස් ඇති බව පෙනේ.

ආවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ යුගයේ පැවති දේශීය කුඩා කර්මාන්ත යනාදිය ආර්ථික නිර්බාධිකරණයත් සමඟ වෙළඳපොළෙන් ඉවත් වීම නිසා සහ ප්‍රෝත්සහන ප්‍රමාණවත් නොවීම නිසා දේශීයව නිපදවූ ඇතැම් භාණ්ඩ සඳහා ඉල්ලුම අඩු විය. එයින් ග්‍රාමීය දුප්පත් ජනතාවගේ ආදායම් මට්ටම අඩු වූ අතර දුප්පත් පොහොසත් පරතරය තවදුරටත්

වර්ධනයවිය. මෙම තත්ත්ව හේතු කොටගෙන රටේ ඉහළ ආදායම් ලබන්නන්ගේ ආදායම් මට්ටම ඉහළ ගිය ද සමස්තයක් ලෙස රටේ සියලු මට්ටම්වල ආදායම් ලබන්නන්ගේ තත්ත්වය දියුණු වීමට අවස්ථාවක් උදාවී නොමැත.

වගු අංක 2 : මධ්‍යම ආදායමේ ගිණි සංගුණකය

| සංගණන වර්ෂ | | | | | |
|---|---|---|---|---|---|
| කාණ්ඩය | 1980/1981 | 1990/1991 | 2002 | 2005 | 2009/2010 |
| කුටුම්භ ආදායම | 0.43 | 0.43 | 0.47 | 0.43 | 0.49 |
| කුටුම්භ වියදම | - | - | 0.36 | 0.40 | 0.37 |

මූලාශ්‍රයඃ කුටුම්භ ආදායම් සහ වියදම් සංගණනය 1981 සිට 2009/2010, ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

වර්ෂ 1986/1987 කාලයේදී ඉහළ ආදායම් ලබන 20% කාණ්ඩයට මුලු ආදායමෙන් හිමි ප්‍රතිශතය 52.3% සිට 49.4% දක්වා අඩු වී ඇත. එමෙන්ම 1996/1997 කාලයේදී පහළම ආදායම් ලබන 20% කාණ්ඩයට මුලු ආදායමෙන් හිමිවන ප්‍රතිශතය 5% සිට 5.7% දක්වා ඉහළ ගොස් ඇත. එමගින් තහවුරු වන්නේ මෙම කාලයේ දී ක්‍රියාත්මක වූ ආදායම් ප්‍රතිව්‍යාප්ති වැඩසටහන් මගින් කිසියම් මට්ටමකට අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වී ඇති බවයි.

නමුත් 2006/2007 කාලය සැළකීමේදී පෙනී යන්නේ එම කාලයේදී නැවතත් මෙරට ආදායම් ව්‍යාප්ති විෂමතාවය ඉහළ ගොස් ඇති බවයි. ප්‍රමාණාත්මක විසරණ අනුපාතය (Quantity Dispersion Ratio) පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ පහළ ආදායම් ලබන 20% ට වඩා 12 ගුණයක වැඩි ආදායමක් ඉහළ ආදායම් ලබන කාණ්ඩය හිමිකර ගන්නා බවයි. ඒ අනුව ශ්‍රී ලංකාව තවදුරටත් ඉහළ ආදායම් ව්‍යාප්ති විෂමතාවක් සහිත රටක් බව තහවුරුවේ.

පහත වගු අංක 03 දත්ත වලට අදාළව තහවුරු වන්නේ 1990-2010 කාලය තුල සිදුවූ ආර්ථික වර්ධනය මගින් දුප්පතුන්ගේ ආදායම් මට්ටම යම්තරමක් ඉහළ නැංවීමට හැකියාවක් ලැබුනද ආදායම් ව්‍යාප්ති විෂමතාවය ප්‍රමාණවත් ලෙස අඩු කර ගැනීමට අසමත්වූ බවයි.


1953 සිට 2002 දක්වා කාලයට අදාළව ඒක පුද්ගල ආදායමේ වෙනස සහ දුප්පත්ම 40% අයත් ඒක පුද්ගල ආදායම් වෙනස අතර සම්බන්ධතාවය විශ්ලේෂණයේදී පෙනී යන්නේද ඒ අතර දුර්වල සහ-සම්බන්ධයක් පවතින බවයි (Papanek 2004). මෙය රූප සටහන 01 මගින්ද පෙන්නුම් කරයි. වගු අංක 3 හි අවසන් තීරුවේ 2006/07 සිට 2009/10 කාල පරාසය සඳහා දරිද්‍රතා ආපාතයේ සිදු වූ ප්‍රතිශතක වෙනස දැක්වේ.

වගු අංක 3: ආර්ථික අංශ අතර දරිද්‍රතා ආපාතය

| අංශ | 1990/91 | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2006/07 - 2009/10 Δ% |
|---|---|---|---|---|---|---|
| නාගරික | 16.3 | 14.0 | 7.9 | 6.7 | 5.3 | 20.9 |
| ග්‍රාමීය | 29.4 | 30.9 | 24.7 | 15.7 | 9.4 | 40.1 |
| වතු | 20.5 | 38.4 | 30.0 | 32.0 | 11.9 | 62.8 |
| සාමාන්‍ය | 26.1 | 28.8 | 22.7 | 15.2 | 8.9 | 41.4 |

මූලාශ්‍රය: සංගණන වාර්තා 1990-2010 දක්වා ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

රූප සටහන 1: ඒක පුද්ගල ආදායමේ වර්ධනය සහ ආදායම් විෂමතාවය අතර සංසන්දනයක්




## නිගමනය

ශ්‍රී ලංකාව නිදහස ලැබූ මුල් අවධියේ සිටම ඉහළ ආදායම් සහ සම්පත් ව්‍යාප්ති විෂමතාවක් සහිතවේ. කෙසේවුවද නිදහස් අධ්‍යාපනය සහ

සෞඛ්‍ය පහසුකම් නිසා එය යම් තරමකට පාලනය කරගත හැකිවිය. අනුක්‍රමික සමාජ ආර්ථික ප්‍රතිපත්ති හරහා බහුතරයක් දුප්පත් ජනතාවගේ ආදායම් මට්ටම සහ ජීවන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ ද එය සමාජයේ විවිධ කණ්ඩායම් අතර ආදායම් විෂමතාවය අඩු කිරීම කෙරෙහි ඉවහල්වී නොමැත.

මේ අනුව 2015 දී ආර්ථික වර්ධනය අතින් ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 4000 දක්වා වර්ධනයට ශ්‍රී ලංකා මහ බැංකුව ඉලක්ක පිහිටවුවද මෙරට ආදායම් ව්‍යාප්ති විෂමතාවය අවම කිරීම සම්බන්ධයෙන් අදාල සැලසුම්, ඉලක්කගත පැහැදිලි වැඩ සටහන් හා ප්‍රතිපත්ති පවතින්නේ ද යන්න ප්‍රශ්නාර්ථයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Lakshman, WD 1997, ‘Income Distribution and Poverty, in W D Lakshman, eds., Dilemmas of Development: Fifty Years of Economic Changes in Sri Lanka’, *Sri Lanka Association of Economists*, Colombo, p. 171- 219.

Papanek, GF 2004, ‘Pro-poor economic growth research studies and guidelines: Poverty and income distribution, project manual’, *United States of America International Development (USAID).*

Todaro, MP & Smith, SC 2012, *‘Economic Development’*. 11th edition. Addison-Wesley, New York.

Vidanapathiran, U 2007, ‘Emerging income inequality and widening economic divide: The case of Sri Lanka 1977-2006’.

Wahiba, NF & Weriemmi, ME 2014, ‘The Relationship between Economic Growth and Income Inequality’. *International Journal of Economics and Financial Issues*. vol. 4 no 1, pp. 135-143.

# Appendix

වගු අංක 04 : පංචමකය අනුව කුටුම්භ ආදායම

| කාණ්ඩය | අවම 20% | මධ්‍යම් අවම 20% | මධ්‍යම 20% | ඉහළ-මධ්‍යම 20% | ඉහළ 20% | සමස්ත |
|---|---|---|---|---|---|---|
| මසකට කුටුම්භ ආදායම (රුපියල්) | 8211 | 16062 | 23880 | 35552 | 98575 | 36451 |
| ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 4.5 | 8.8 | 13.1 | 19.5 | 54.1 | 100 |
| ආදායමේ සමුච්චිත ප්‍රතිශතය | 4.5 | 13.3 | 26.4 | 45.9 | 100 | |
| ආදායමේ සමුච්චිත ප්‍රතිශතය | 20 | 40 | 60 | 80 | 100 | |

මූලාශ්‍රයඃ කුටුම්භ ආදායම් සහ වියදම් සංගණනය 2009/2010 ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව